# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශේෂ

**අංක 1101/9 - 1999 ඔක්තෝබර් 13 වැනි බදාද - 1999.10.13**

**(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)**

1 ,වැනි කොටස : (1) වැනි ඡේදය - සාමාන්‍ය


**ආණ්ඩුවේ නිවේදන**

**රාජ්‍ය සේවයේ මෝටර් රථ රියැදුරන් සඳහා ඒකාබද්ධ රියැදුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහය**

1993 සැප්තැම්බර් මස 29 වැනි බදාද දින 786/10 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1993 ජනවාරි මස 01 වැනි දින දරන ව්‍යවස්ථා සංග්‍රහය වෙනුවට පහත සඳහන් රාජ්‍ය සේවයේ මෝටර් රථ රියැදුරන් සඳහා ඒකාබද්ධ රියැදුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහය පළ කරනු ලැබේ.

මහින්ද බන්දුසේන,
ලේකම්,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය.

1999 ඔක්තෝබර් මස 06 වැනි දින,
කොළඹ 07, නිදහස් චතුරශ්‍රයෙ,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේදිය.

1. ක්‍රියාත්මක වන දිනය: 1993 සැප්තැම්බර් මස 29 වෙනි දින අංක 786/10 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඇති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1993 සැප්තැම්බර් මස 23 වැනි දින දරන ඒකාබද්ධ රියැදුරු ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන යටතේ ගන්නා ලද යම් ක්‍රියා මාර්ගයකට හානියක් නොවන පරිදි මෙම ව්‍යවස්ථා සංග්‍රහයේ 1999 ඔක්තෝබර් මස 01 දින සිට ක්‍රියාත්මක වනු ඇත.

2. නිර්වචන:

2:1 "ව්‍යවස්ථා සංග්‍රහය" යන පදයෙන් අදහස් කරන්නේ රාජ්‍ය සේවයේ ඒකාබද්ධ රියැදුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයයි.

2:2 "සේවය" යන පදයෙන් අදහස් කරන්නේ රාජ්‍ය සේවයේ මෝටර් රථ රියැදුරු සේවාවයි.

3. සංයුතිය:

3:1 රාජ්‍ය සේවයේ මෝටර් රථ රියැදුරන් සඳහා වන ඒකාබද්ධ රියැදුරු සේවයේ සංයුතිය පහත දක්වෙන පරිදි වේ.

(අ) 11 වැනි පන්තියේ "ආ" ඛණ්ඩයට බඳවා ගනු ලබන අය

(ආ) 11 වැනි පන්තියේ "අ" ඛණ්ඩයට උසස් කරනු ලබන අය

(ඇ) 1 වැනි පන්තියට උසස් කරනු ලබන අය සහ 1 පන්තියට කෙළින්ම බඳවා ගනු ලබන අය

4. සේවක සංඛ්‍යාව :- සේවක සංඛ්‍යාව, වාර්ෂික ඇස්තමේන්තුව ඒ ඒ වැය ශීර්ෂයෙන් හා සම්මතය යටතේ දක්වනු ලබන අතර, ඒ ඒ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල රියැදුරු සේවයේ මුළු සේවක සංඛ්‍යාව (භාණ්ඩාගාරයේ ) අයවැය අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කර ඇති මුළු රියැදුරු සේවක සංඛ්‍යාව නොඉක්මවනු ඇත.

5. වාර්ෂික ඒකාබද්ධ වැටුප් පරිමාණය

| | |
|---|---|
| I පංතිය | - රු. 54,480 - 9 x 1,320 - 8 x 1,560 - රු.78,840/- (විශේෂ බඳවා ගැනිමකදී රු. 58,440/- ට පෙර කාර්යක්ෂමතා කඩ ඉමකි.) |
| II"අ" පංතිය | - රු. 47,880 - 14 x 1,320 - 6 x 1,560 - රු.75,720/- (රු. 49,860/- ට පෙර කාර්යක්ෂමතා කඩඉමකි) |
| III "ආ" පංතිය | - රු. 45,180 - 23 x 1,320 - 6 x 1,560 - රු.75 .540/- (රුපියල් 49,140/- ට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.) |

6. පාලනය:

6:1 "සේවය" ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂගේ පාලනයට යටත් වනු ඇත.

7. බඳවා ගැනීමේ ක්‍රමය :

7:1 බඳවා ගැනීමේදී රජයේ ගැසට් පත්‍රය මගින් හෝ ප්‍රසිද්ධ දැන්වීමක් මගින් හෝ වෙනත් සුදුසු ආකාරයකින් ඉල්ලුම් පත් කැඳවිය යුතුය. අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයකටද පෙනී සිටිය යුතුය.

7:2 සේවයට බඳවා ගැනීම ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂගේ අනුමැතිය මත අමාත්‍යාංශ ලේකම්වරුන්/දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් සිදුකරනු ලැබේ. බඳවා ගැනීම් රාජ්‍ය පරිපාලන විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් හෝ ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ විසින් නියම කර න පරිපාටියට අනුකූලව සිදු කෙරේ.

7:3 බඳවා ගැනීම් අදාළ දෙපාර්තමේන්තුවේ එක් නියෝජිතයෙකු, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ මෝටර් වාහන පරීක්ෂකවරයෙකු හා පොලිස් රථවාහන අංශයේ නිලධාරියෙකුගෙන් ද සමන්විත තිදෙනෙකුට නොඅඩු මණ්ඩලයක් මගින් පවත්වනු ලබන රිය පැදවීමේ නිපුණත්වය මැනීමේ වෘත්තීය පරීක්ෂණයක් මගින් සිදු කළ යුතුය.

7:4 විධිමත් පත්වීම් ලිපි ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ විසින් නිකුත් කරනවා ඇත.

8. බඳවා ගැනීමේ සුදුසුකම්:- II 'ආ" පන්තියේ රියැදුරන් බඳවා ගැනීමේ සුදුසුකම්:

8:1 ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.

8:2 තනතුර සඳහා ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. රජයේ සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ යෙදී සිටින අය සම්බන්ධයෙන් උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

8:3 අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත පාසලකින් අවම වශයෙන් අට වන ශ්‍රේණිය/නවය වසර සමත් වී සිටිය යුතුය.

8:4 පෞද්ගලික/කුලී රථ සහ තාර බර හොන්ඩර 24 ට අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද නිපුණත්වය පිළිබඳ සහතිකයක් ලබා සිටිය යුතුය. (බඳවා ගන්නා දිනට වසර තුනකට පෙර අදාළ සහතිකය ලබා තිබිය යුතුය.) (වාහන පංති සී සහ සී1)

8:5 වාහන රියැදුරෙකු වශයෙන් වසර තුනක පළපුරුද්දක් තිබිය යුතුය. (සහතික මගින් සනාථ කළ යුතුය)

8:6 අවම උස අඩි 05 අඟල් 2 1/2 ක් විය යුතුය.

8:7 දිවා කාලයේ සහ රාත්‍රි කාලයේ දී සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්ත්වයක සිටිය යුතු අතර, මනා ඇස් පෙනීමක් තිබිය යුතුය.

8:8 මහාමාර්ග නීති සංග්‍රහය පිළිබඳ මනා දැනුමක් තිබිය යුතුය.

9. රියැදුරු 11 "අ" පන්තියට උසස් කිරීම

9:1 (1) පරිවාස කාලය අවසානයේ සේවයේ ස්ථිර කර තිබිය යුතුය.
(11) 11 "ආ" පන්තියේ වසර 08 ක සේවයක් තිබිය යුතුය.
(111) උසස්වීම් ලබන දිනට පූර්වාසන්න වසර 05 ක කාලයක් තුළ සතුටුදායක සේවා කාලයක් තිබිය යු.තුය.
(1V ) අදාළ කාර්යක්ෂමතා කඩඉම් සමත් වී තිබිය යුතුය.

9:2 තාර බර හොන්ඩර 34 දක්වා වන සැහැල්ලු ලොරි සහ මගීන් 32 කට නොවැඩි සංඛ්‍යාවක් ගෙනයාහැකි බස් රථ සඳහා රියැදුරු බලපත්‍ර ලබා තිබීම. (ඒ 1 හා සී 1 පංතියේ බලපත්)

9:3 ඉහත කොන්දේසි සපුරන නිලධාරීන් පිළිබඳ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ නිර්දේශ ලැබීමෙන් පසු ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ විසින් උසස්වීම් ලිපි නිකුත් කරනු ලැබේ.

10. පළමු වන පංතියට උසස් කිරීම

10:1 (1) 11"අ" පංතියේ වසර 10 ක සේවා කාලයක් තිබිය යුතුය.
(11) උසස්වීම් ලබන දිනට පූර්වාසන්න පස් අවුරුද්ද තුළ සතුටුදායක සේවා කාලයක් තිබිය යුතුය.
(111) අදාළ කාර්යක්ෂමතා කඩඉම් සමත් වී තිබිය යුතුය.
(1V ) තාර බර හොන්ඩර 34 ට වැඩි බර මෝටර් වාහන සහ බර ට්‍රේලර්, සහ මගීන් 32 ට වඩා ගෙන යා හැකි බලපත්‍ර ලබා ඇති බස් රථ පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් වරයා විසින් නිකුත් කරන ලද නිපුණතාවය පිළිබඳ සහතිකයක් ලබා තිබිය යුතුය.(ඒ පංතිය)

10:2 ඉහත කොන්දේසි සපුරන නිලධාරීන් පිළිබඳ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශ ලැබීමෙන් පසු ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ විසින් උසස්වීම් ලිපි නිකුත් කරනු ලබයි.

10:3 උසස්වීම් සඳහා උසස්වීම් පරිපාටියේ දක්වා ඇති අවම සේවා කාලය ගණනය කිරීමේදී වැටුප් රහිත නිවාඩු මත වන දේශීය හෝ විදේශීය නිවාඩු කාල සීමාවන් බැහැර කරනු ඇත.

11. සතුටුදායක සේවා කාලය පිළිබඳ අර්ථකථනය:

11:1 උසස්වීම් ඉල්ලුම්කරන දිනට පූර්වාසන්න අවුරුදු 05 ක කාලය තුළ වරදකට (අවවාද කිරීමක් හැර) දඬුවමක් ලබා නැත්තාවූද, පැමිණීම, වැඩ හා හැසිරීම සතුටුදායක වූවද, එම කාලය තුළ යෙදුණු සියලු වැටුප් වර්ධක ලබා ඇත්තාවූද නිලධාරියෙකු පමණක් සතුටුදායක සේවා වාර්තාවක් ඇත්තෙකුසේ සළකනු ලැබේ.

12. කාර්යක්ෂමතා කඩඉම්

12:1 පහත සඳහන් නිලධාරීන්ගෙන් යුත් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පැවැත්විය යුතුය.

(1) අදාළ දෙපාර්තමේන්තුවේ එක් නියෝජිතයෙකු සභාපති ලෙස
(11) මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් දෙපාර්තමේන්තුවේ මෝටර් රථ වාහන පරීක්ෂකයෙකු

(111) පොලිස් රථ වාහන අංශයේ නිලධාරියකු

12:2 පහත සඳහන් නිර්නායක උපයෝගි කරගත යුතුය.

| නිර්නායක | | ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| (1) | මහාමාර්ග නීති පිළිබඳ ප්‍රායෝගික දැනුම | 40 |
| (11) | මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | 40 |
| (111) | පැමිණීම, වැඩ, හැසිරීම | 20 |
| | | 100 |

12:3 වයස පදනම් කරගෙන කාර්යක්ෂතා කඩඉම් සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු නොලැබේ.

12:4 නියමිත දිනයන්හිදී තම අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පැවැත්වීම දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ වගකීමකි.

13. සේවයේ නියුක්ත කිරීම:

13:1 සියලුම නිලධාරීන් ස්ථාන මාරු කිරීම්වලට යටත් වේ. ඔවුන් දිවයිනේ කවර හෝ පෙදෙසෙකට පත් කරනු ලැබිය හැකිය.

13:2 ස්ථාන මාරුවීම්:

13:2:1 අමාත්‍යාංශ අතර ස්ථාන මාරු කිරීම් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ විසිනි.

13:2:2 එකම අමාත්‍යාංශය තුළ දෙපාර්තමේන්තු අතර ස්ථාන මාරු කිරීම් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂකට දැනුම් දෙමින් අදාළ ලේකම් විසිනි.

13:2:3 එකම දෙපාර්තමේන්තුව ඇතුලත සේවා ස්ථාන මාරු කිරීම් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂකට දැනුම්දෙමින් දෙපාර්තමේන්තු ප්‍රධානියා විසිනි.

13:2:4 අමාත්‍යාංශ යටතට නොවැටෙන දෙපාර්තමේන්තු අතර කරන ස්ථාන මාරුවීම් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ විසින් කරනු ලැබේ.

14. සේවයේ නියුක්ත රියැදුරන් නව ප්‍රතිෂ්ඨාපිත සේවාවට අන්තර් ග්‍රහණය කිරීම.

14:1 නියමිත දිනයේදී ඒකාබද්ධ රියැදුරු සේවාවේ රියැදුරන් මෙම ව්‍යවස්ථාවේ දක්වෙන බඳවා ගැනිමේ පරිපාටියට අනුව පහත දක්වෙන අන්දමට රියැදුරු සේවයේ නව පංති සහ ශ්‍රේණිවලට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

14:1:1 අවුරුදු 08 ක සේවා කාලයක් නැත්තාවූද, අවුරුදු 08 ක් සම්පූර්ණ කළ ද 09 වන වගන්තිය යටතේ 11 "අ" පංතියට සුදුසුකම් නොලබන්නාවූද අය සේවයේ 11"ආ" පංතියට අදාළ පරිදි අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

14:1:2 නියමිත දිනයේදී සේවයේ 11"ආ" පංතියේ රියැදුරෙකු ලෙස අවුරුදු 08 ක් ගත වී ඇති මෙම ව්‍යවස්ථාවේ 09 වන වගන්තිය යටතේ සුදුසුකම් ලබන්නාවූ අය සේවයේ 11 "අ" පංතියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

14:1:3 නියමිත දිනයේදී සේවයේ 11"අ" පංතියේ අවුරුදු 10 ක් ගතවී ඇති මෙන්ම මෙම ව්‍යවස්ථාවේ 10 වන වගන්තිය යටතේ සුදුසුකම් ලබන්නාවූ අය සේවයේ 1 පංතියට අන්තර් ග්‍රහණය කරනු ලැබේ.

14:1:4 ඉහත 14:1:3 අනුව 1 පංතියට අන්තර් ග්‍රහණයට සුදුසුකම් නොලබන දැනට 11"අ" පංතියේ සිටින රියැදුරන් තවදුරටත ් නව ප්‍රතිෂ්ඨාපිත 11"අ" පංතියට අන්තර් ග්‍රහණය කරනු ලැබේ.

14:1:5 දැනට 1 පංතියේ සිටින සියලුම රියැදුරන් නව ප්‍රතිෂ්ඨාපිත සේවාවේ 1 පංතියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ

14:2 ඉහත 14:1 වගන්තියේ සඳහන් අන්තර්ග්‍රහණය කරනුයේ මෙම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනයේ සිටය.

15. පරික්ෂාව හා පුහුණුව: සියලුම රියැදුරන් වරින් වර කරනු ලබන පරික්ෂා කිරීම් හා පුහුණු කිරීම් මගින් රියැදුරු සේවයේ ගුණාත්මකභාවය හා සේවා තත්ත්වයෙහි වැඩි දියුණුවක් අපේක්ෂා කරනු ලැබේ. මේ සම්බන්ධව පොදු උපදෙස් මාලාවක් නිකුත්කරනු ලැබේ.
(මෙම පොදු උපදෙස් මාලාව 18 හි දක්වා ඇත.)

16. වෙනත් විධිවිධාන:

මෙම ව්‍යවස්ථා සංග්‍රහයේ ඇති විධිවිධානවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධාන වලටද, මුදල් රෙගුලසිවලටද, දෙපාර්තමේන්තු නියෝගවලටද, රජය විසින් වරින් වර නිකුත් කරනු ලබන වෙනත් විධිවිධාන හා නියෝග වලටද අනුකූලව ක්‍රියා කිරීමට සියළුම නිලධාරීන් බැඳී සිටිති.

17. විධිවිධාන සළකා නැති කරුණු: මෙම ව්‍යවස්ථාවේ විධිවිධාන පිළිබඳ අර්ථ කථනය සම්බන්ධව ආයතන අධ්‍යක්ෂ විමසමින් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ විසින් තීරණය කරනු ඇත.

18. රියැදුරු සේවයේ ගුණාත්මක භාවය හා සේවා තත්ත්වයේ සංවර්ධනය කිරීම සඳහා වූ පොදු උපදෙස් මාලාව:

(1) රාජ්‍ය සේවයට එක්වන සියලුම රියැදුරන් සඳහා රාජ්‍ය සේවාව පිළිබඳව, නිසි අවබෝධයක් ලබාදිය යුතුය(විනය හා පැවැත්ම , අයිතිවාසිකම් හා යුතුකම් ආදිය)
(11) කාර්යක්ෂම රාජ්‍ය සේවයක ඇති අවශ්‍යතාවය හා ඒ සඳහා රියැදුරන් සතු වගකීම පිළිබඳව වරින් වර දැනුවත් කළ යුතුය.
(111) මහාමාර්ග නීති සංග්‍රහය පිළිබඳව පොලිස් රථවාහන අංශයේ සහයෝගයෙන් වාර්ෂිකව පුහුණු වැඩමුළු සඳහා සහභාගි කරවිය යුතුය.
(1V) මෝටර් කාර්මික දැනුම හා වාහන නඩත්තුව සඳහා පිළිගත් ආයතනයක් මගින් ප්‍රවීනත්වය ලබාදිය යුතුය.